2009 දෙසැම්බර් 14 ''A World to Win'' (දිනා ගැනුමට ලොවක් ඇත) ප්‍රවෘත්ති සේවය.

# ඉන්දීය හරිත දඩයම් මෙහෙයුම: අනිශ්ඨ බියකරු අපරාධයක් සමීප කරයි.

ඊසාන දිග ඉන්දියාවේ ජාර්ක්හෑන්ඩ්, ඔරිස්සා, චටිස්ගාර්, ආන්ද්‍රා ප්‍රදේශ්, සහ මහාරාෂ්ට්‍රා ප්‍රාන්ත රාජ්‍ය හරහා බටහිර බෙංගාලය දෙසින් මාඕවාදය නොහොත්, රතු කොරිඩෝව හාත්පස විහිදී යයි. දන්දකර්ණයා වනාන්තරය ඇතුළුව බොහෝ වනාන්තර ඊට අඩංගු වේ (උප මහද්වීපයේ මුල් පදිංචිකරුවන් වූ ජනවාර්ගික හා ගෝත්‍රික කණ්ඩායම් හිංදු වූහ). මෙහි විසූ මිලියන ගණන් ආදිවාසීන්, වනාන්තර ගම්මාන වලට පළවා හරින ලද්දේ ආක්‍රමණික කල්ලි විසිනි; එමෙන්ම හිංදු සමාජයේ ප්‍රධාන ධාරාවෙන් මොවුන් බහිෂ්කරණය කරන ලදි. ඔවුන්ට ඇත්තේ කැරලිවලින් පිරි ඉතිහාසයකි; 1855-57 සන්තාල් කැරැල්ලේ සිට ගිණිය නොහැකි කුඩා ජනතා නැගිටීම්, යුධමය සටන් සියල්ල බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයට එරෙහිව සිදු විය; එසේම කොමියුනිස්ට් වරුන්ට සංවිධානය වීම සඳහා ප්‍රධාන කඳවුරක්ව පවතී.

ආදිවාසීන් කේන්ද්‍රගතවී සිටින මෙම වනාන්තරවල ඛණිජ සම්පත් ධන නිධි බහුලය (යකඩ, ගල් අඟුරු, බොක්සයිට්, මැංගනීස්, කොරන්ඩම්, රත්‍රං, දියමන්ති සහ යුරේනියම්). පසුගිය වසර වල ඉන්දීය රාජ්‍ය යන්ත්‍රයේ රැකවරණය යටතේ විදේශීය හා ඉන්දීය සංස්ථා සමාගම් එක්ව මේවා සූරා කමින් මඩි තර කර ගනිමින් සිටින්නේ මේ ක්‍රියාවලියේ දහදුක් විඳින ජනතාව අධික ලෙස පීඩාවට පත් කරවමිනි. වන සම්පත බේරා ගැනීම හා ඉඩම් අයිතිය මහත් සේ අවශ්‍ය වන වැදගත්ම අංශයක් වෙයි.

''රතු කොරිඩෝව'' තුළ පාර්ශ්ව දෙකක් හැඩ ගැසෙමින් පවතී. ඉන්දීය මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය සහ ආදිවාසීහු එක් පාර්ශ්වයක් වෙති. 1070 සිට කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෝ එම වකවානුවේ, ඒ වන විට විප්ලවවාදී වූ චීනයේ සහ මාඕවාදයේ පරම අනුග්‍රහය ලත් නක්සල්බාරි කැරලිකරුවන් අනුව යමින්, ආදිවාසීන් සමග ජීවත් වෙමින් හා උරෙනුර අරගලයේ යෙදෙමින් සිටියහ. ඉන්දියානු රජය විසින් ගෝත්‍රිකයින්ගේ ඉඩම් බලයෙන් පැහැර ගැනීමට එරෙහිවත්, ශ්‍රම සංචිතයක් ලෙසින් මොවුන්ව රටේ හැම තැනෙකම විසුරුවා නිරාහාරව සිටින තත්ත්වයට ඇද දැමීමට විරුද්ධවත්, පොලිස් නිළධාරීන් හා බලධාරීන් අතින් මොවුන් දූෂණය වීම, වධ හිංසාවලට හා අවමානයට ලක් වීමට එරෙහිවත්, යුක්තිය හා සාධාරණ ඉල්ලීම් සඳහා ඔවුන් ගෙන යන අරගලවලට මාඕවාදීහු නිතර නායකත්වය සපයා තිබුණි. මුස්ලිම්වරුන් හා දාලිත්වරුන් (හින්දූන් විසින් කුලහීනයන් ලෙස පහත් කරනු ලැබූවන්) ඇතුළු ඉඩම් අහිමි දිළිඳු ගොවීන්ට මාඕවාදීහු ආධාර උපකාර කර තිබේ. යැපුම් කෘෂි කාර්මික ක්‍රමවේදයන් වර්ධනය කර ගැනීම සඳහාත්, ලිං සකසා ගැනීමටත්, ඉගැන්වීමේ කටයුතුවල නිරත වීමෙන් සහ පසුගාමී වැඩවසම් ව්‍යවහාරයන්ට, ක්‍රියාමාර්ගයන්ට (උදා:- මායා කර්ම සිදු කරන්නේයැයි කාන්තාවන්ට චෝදනා කර දඬුවම් පැමිණවීමේ ම්ලේච්ඡ ප්‍රතිපත්තිය) එරෙහිව අරගල කිරීම සඳහා ජනතාව සංවිධානය කර ගැනීමට ඔවුහු උදව් කර තිබේ. මෙවැනි සියළු කටයුතු ඉටු කිරීම වෙනුවෙන් මාඕවාදීන්ට ත්‍රස්තවාදීන් ලෙස හංවඩු ගසා ඉන්දියානු රජයට බලපාන අභ්‍යන්තර දැවැන්ත තර්ජනය ලෙස හුවා දක්වති.

අනෙක් පාර්ශ්වය වන මධ්‍යම ඉන්දීය රජය වෙනුවෙන් පෙනී සිටින හමුදාව සහ පොලීසිය, පාලක පංතියේ ආරක්ෂකයෝ හා නියෝජිතයෝ වන මොවුහු ඉන්දියානු බහුජනයාගේ ජීවිත උරා බොමින් වාසය කරති. රජයේ ව්‍යාපෘති වලට පර්යන්තයෙන් වූ මෙම වනාන්තර වලින් ගැවසුණු කඳු හුදෙකලා කොට සැලකීමට මොවුහු පුරුදුව සිටි අතර කිසිදු සංවර්ධනයක් ආදිවාසීන්ට අත් කර නොදී ඔවුන් අතිශය දිළිඳු අඩියකට ඇද දැමුවා පමණක් නොව ඔවුන්ගේ ශ්‍රමයෙන් ලාභ ඉපයීමටද අමතක නොකළේය. ආදිවාසීන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් විවිධ රැකියා සොයමින් පන්ජාබි වැනි ප්‍රාන්ත වලට සංක්‍රමණය වී සිටී. දැවැන්ත පසුගාමීත්වයක් මේ කඳුකර ප්‍රදේශවලට උරුම කරමින් ඉන්දීය ධනවාදී සංවර්ධනයට මේ මගින් ඉන්ධන සපයා ඇත. දැන් ඉන්දීය රජයේ හදිසි අවශ්‍යතාවය වී ඇත්තේ මෙම ප්‍රදේශවල පවතින සම්පත් උපරිම වශයෙන් සූරා කෑමට විදේශ ආයෝජකයන්ට හා ධනවාදී සංවර්ධනයට බාධාවක්ව පවතින තත්ත්වයන් අහෝසි කරලීමයි. ඔවහු වඩාත් කණගාටුවට පත්වී ඇත්තේ මාඕවාදීන් හා ජනතාව අතර පවතින ගැඹුරු බැඳීම පිළිබඳවයි. ඔවුන්ගේ ඉලක්කය වී ඇත්තේ බහු ජනතාව විශ්වාසය තබා ඇති යහපත් ලෝකයක් පිළිබඳ පවතින විප්ලවීය දැක්ම සහ එම දැක්ම මූර්තිමත් කරන සියලු බලවේග අතුගා දැමීමයි.

හරිත දඩයම් මෙහෙයුම ඇරඹීමත් සමග, ඉන්දීය පැරාමිලිටරි බලකායේ බැටෑලියන් 6 ක් (එක් බැටෑලියනයක් සොල්දාදුවන් 700 කින් සමන්විත වේ.) මහරාෂ්ට්‍රා ප්‍රාන්තවල සහ චටිස්ගා(ර්)වල ස්ථානගත කර ඇත. පොලිස් මාධ්‍ය ප්‍රකාශක ප්‍රකාශ කළේ මෙම ප්‍රදේශවලින් මාඕවාදීන් පළවා හැරීමෙන් පසුව, පොලිස් බලඇණි වලට ප්‍රති-ගරිල්ලා

සටන් පුහුණු කිරීම් සමගින්, ප්‍රාන්තයෙන් ප්‍රාන්තයට මෙම මෙහෙයුම දියත් කරන බවයි. මාඕවාදීන්ව සහ ඔවුනට සහයෝගය දැක්වීමට ඉදිරිපත් වන අයද 2010 වසරේ මාර්තු මස වන විට මුලින් උපුටා දැමීම මෙම බල ඇණි වල අපේක්ෂාවයි. ඉන්දීය රජයේ දළ ඇස්තමේන්තුවට අනුව, මධ්‍යම පැරාමිලිටරි (යුධ හමුදා බල ඇණිවලට සමාන හමුදාවක්) හමුදාවලින් 60,000 කට වැඩි ආරක්ෂක භටයින් 6,000 - 7,000 ක් පමණ වන සන්නද්ධ මාඕවාදී කාඩර්වරුන්ට එරෙහිව සටන් වැදීමට නියමිතය. නිළධාරීහු පැමිණිලි කරන්නේ මාඕවාදීන් තදින් සන්නද්ධව සිටින නමුත් ඔවුන් සතුව තිබෙන මෙම ආයුධ රජයේ හමුදා වලින් පැහැර ගත් ඒවා බවයි.

වනාන්තර වල යුධ කටයුතු පිලිබඳ විශේෂ පුහුණුව ලත් හමුදාවක මෙහෙයුමේ පසු අදියරවල, අධිෂ්ඨාන මෙහෙයුම උදෙසා කොමාන්ඩෝ බල ඇණිය (Commando Battalion for Resolute Action - CoBRA) මෙකී ප්‍රදේශවලට අවතීර්ණ වනු ඇත. මෙම සේනාංක මාඕවාදීන් වෙසෙන ප්‍රදේශ සියල්ල ''වනසා දමා'' එම ප්‍රාන්ත සිය ග්‍රහණයට හසු කොටගත් වහාම ඊළඟ අදියර දියත් කරනු ඇත. එවිට රජයේ විවිධ ආයතන ''සංවර්ධන කටයුතු'' මූලාරම්භ කරනු පිණිස එම ප්‍රදේශ කරා සේන්දු වනු ඇත. (ඉන්දියා ටයිම්ස්, 2009 නොවැම්බර් 02)

ගෙවී ගිය වසර වල, ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) - CPI(M) සහ ඔවුන්ගේ සහයෝගිතා මූල කඳවුරු ඉන්දීය රජය විසින් දියත් කරන ලද බරපතල ප්‍රහාර හමුවේ එඩිතරව ඉදිරිපත් වී සටන් මෙහෙයවා තිබුණි. වියට්නාමයේදී ගරිල්ලා භටයින් හා මහජනතාව වෙන්කර තබා ගැනීමට ඇමෙරිකාව යෙදූ ''මූලෝපායික යුධ කුඩා ගම්මාන'' (strategic hamlets) ආදර්ශ කොට ගනිමින් වධකාගාර හිර ගෙවල් වැනි කඳවුරු වලට ජනතාව බලත්කාරයෙන් ගාල්කර ඔවුනට මිහිපිට අපායක් මවනු පිණිස **සල්වා ජුදුම්** (Salwa Judum) වැනි ප්‍රාදේශීය පැරාමිලිටරි කණ්ඩායම් යොදවමින් විප්ලවවාදීන් හා ජනතාව අතර V හැඩයේ බාධකයක් නිර්මාණය කිරීමට රජය උත්සාහ දරමින් සිටී. බිම් මට්ටමේ කාඩර්වරු මෙම සටන්වලදී මරා දමන ලදි. වැදගත් විප්ලවවාදීන් සිර භාරයට ගෙන තිබුණි. ඒ අතරම ''සැකපිට සිදු කරන මිනී මැරීම්වලින්'' බොහෝ දෙනෙකු මරා දමා තිබුණි; එනම්, පොලීසිය මිනිසුන් අත් අඩංගුවට ගෙන, ඔවුන් ඝාතනය කර, නොයෙක් නොයෙක් තැන් වල මළ සිරුරු වීසිකර, වාර්තා කරන්නේ තුවක්කුවලින් කරන ලද සටන් වලදී මොවුන් මිය ගිය බවයි - මෙය ව්‍යාජෝක්ති භාවිතයයි.

මෙයින් කැරලිකරුවන් ප්‍රමාණාත්මකව වැඩෙයි; එසේම ඔවුන්ගේ බලපෑම දසත පැතිරී යයි. පසුගිය නොවැම්බර් මාසයේ ලාල්ගාර් සහ බටහිර බෙංගාලයේ විප්ලවීය නැගී සිටීම් වල උච්චතම අවස්ථාව එළඹී අතර, බටහිර බෙංගාලය පාලනය කරන, එමෙන්ම බොහෝ කලකට පෙර තම මාක්ස්වාදී සළු පිලි අත්හැර දමන ලද කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්වාදී) ට සම්බන්ධ රජයේ ඒජන්තයින්ව සිය ගම්බිම් වලින් නෙරපීමට ගෝත්‍රික ජනයා බලකර සිටියේය. ධනවත් ඉඩම් හිමියන් හා දූෂිත නිළධාරීන්ට කිසිදු බුරුලක් නොදෙන නිසා ලාල්ගාර් ප්‍රදේශයෙන් ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ට දැවැන්ත සහයෝගයක් ලැබෙයි. ලාල්ගාර්හි විප්ලවීය නැගිටීම් පවතින කාල වකවානුවේදී, බටහිර බෙංගාලයෙහි පළමු නිදහස් කලාපය (Liberated Zone) ලෙස පක්ෂය මෙම ප්‍රදේශය නම් කළේය.

සන්නද්ධ හමුදා හැම අතින්ම ජනතාව තලාපෙලා ඔවුන්ට නින්දා, අපහාස, අවමන් කරමින් සහ සරණාගත කඳවුරු වල ඔවුන්ව ගාල්කරන අන්දම කොල්කටා (කලින් කල්කටා) නාගරික බුද්ධිමතුන් ලාල්ගාර්වලට පැමිණ ප්‍රසිද්ධියේම අනාවරණය කරන ලදි. හරිත දඩයම් මෙහෙයුම ආරම්භයත් සමගම, මෙහි පැමිණි බොහෝ ප්‍රකට බුද්ධිමතුන් සහ අනිත් අය ජනතාවට එල්ල කරන නිර්දය ප්‍රහාර දැක ඊට එරෙහිව කතා කරන්නට විය.

ඉන්දීය රජය බටහිර බෙංගාලයේ ''රතු කොරිඩෝව'' හි කෙළවර වන, බටහිර ''රතු කොරිඩෝව'' පුරාම සිය පැරාමිලිටරි බල ඇණිවල සන්නද්ධ යාන්ත්‍රණය යොදවා බිය වද්දමින් සිටින අතර, දෙසැම්බර් 02 දා ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) මහජන විමුක්ති ගරිල්ලා හමුදාව පිහිටුවීම (People's Liberation Guerrilla Army) සම්බන්ධයෙන් ප්‍රසිද්ධ උත්සවයක් සංවිධානය කළේය; අසල්වාසී ගම්මාන 50 ක ජනතාව රැස්වීමට සහභාගි විය. ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) දේශපාලන මණ්ඩල සාමාජික, **කිසෙන්ජි** (Kisenji) ද, ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) බටහිර බෙංගාල, ජාක්හෑන්ඩ්, ඔරිස්සා මායිම්වල ප්‍රාදේශීය කමිටු නායක, **රකේෂ්** (Rakesh) ද ඊට සහභාගි විය. ලැජ්ජාවට පත්වුණු උසස් පොලිස් නිළධාරීන් ලාල්ගාර් ඇතුළු ප්‍රදේශවල පවතින ජනතා නැගිටීම් වැටලීමට අසමත්වීම සම්බන්ධයෙන් එම ප්‍රදේශවල තිබෙන පොලිස් ස්ථානවලින් නිදහසට කරුණු විමසා ඇත. ජනතා රැලිය හා උත්සවය පවත්වන දිනය හා ස්ථානය පිළිබඳව ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) පත්‍රිකා මගින් ප්‍රසිද්ධියේම ප්‍රකාශයට පත් කර තිබූ අතර පුළුල් ලෙස ප්‍රචාරය කර තිබුණි.

-------------------------

දිනාගැනීමට ලොවක් ඇත ප්‍රවෘත්ති සේවය (A World to Win News Service){aworldtowin.org}; ලෝකයේ මාක්ස්-ලෙනින්-මාඕවාදී පක්ෂ සහ සංවිධානවල කළලමය මධ්‍යස්ථානය වන විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයේ අනුග්‍රහයෙන් සිදු කරන ලද දේශපාලනික සහ න්‍යායික විමර්ශනය වන දිනාගැනීමට ලොවක් ඇත සඟරාව (A World to Win Magazine) විසින් ඉදිරිපත් කරන ලදි.

පරිවර්තනය
නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
T -13

http:/ /slmarxist.yolasite.com
slmarxist@ymail.com